**පානදුර නගර සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**
---------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 21 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 නොවැම්බර් 19 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය
--------

මෙම වාර්තාවේ 1.3 ඡේදය දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට පානදුර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------------

1:3:1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම
----------------------------------------------------------------

රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 2013 ඔක්තෝබර් 02 දිනැති අංක 3/2013 චක්‍රලේඛය මඟින් ප්‍රකාශයට පත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ට පටහැනිව ඉකුත් වර්ෂවලට අදාල ගිණුම් ශේෂ නිවැරදි කිරීම් සඳහා රු.12,746,820 ක් වූ ශුද්ධ වටිනාකමක් සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වරිපනම් ලේඛන අනුව සමාලෝචිත වර්ෂයේ කොට්ඨාශ අංක 2 හා 5 හි වරිපනම් සඳහා බිල් කර තිබූ ආදායම රු.16,204,400 ක් වුවද, ගිණුම් පිළියෙල කිරීමේදී එම කොට්ඨාශ දෙකෙහි බිල් කළ මුදල රු.11,167,710 ක් ලෙස ගිණුම් ගත කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ වරිපනම් ආදායම හා හිඟ හිටි වරිපනම් ගිණුමේ ශේෂය රු.5,036,690 කින් අඩුවෙන් දැක්විණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ඉටු කර තිබූ හා තවදුරටත් ගෙවිය යුතුව තිබූ සභා කර්මාන්ත වෙනුවෙන් රු.595,428 ක් හා මහ නැඟුම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.29,848,504 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සළසා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයගැති ශේෂය ගණනය කිරීමේදී රු.1,153,998 ක් දෙවරක් සටහන් කර තිබීම, රු.1,500,000 ක් වෙනුවට රු.1,300,000 ක්ද, රු.279,683 වෙනුවට රු.219,583 කද ගිණුම් ගත කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ මූලධන ආධාර හා කර්මාන්ත ණයගැති ශේෂය රු.893,898 කින් වැඩියෙන් දැක්විණි.

(ඈ) එකතුව රු.4,308,010 ක් වූ ආදායම් කපා හැරීම් සහ රු.44,899 ක් වූ සේවක ණය ශේෂ කපා හැරීම් ජර්නල් සටහනක් මඟින් ගිණුම් ගත කළ යුතු වුවත් හරස් සටහන් මඟින් ලැබීම් ලෙස දක්වා ගිණුම් ගත කර තිබුණි. හිඟ ආදායම් ශේෂ වාර්තාවේ එම ආදායම් කපාහැරීම් වර්ෂයේ ලැබීම් ලෙස දක්වා තිබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම
------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 28,838,900 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.49,804,754 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.36,817,618 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000’ | රු.000’ | රු.000’ |
| (i.) | වරිපනම් හා බදු | 40,689 | 29,444 | 22,627 |
| (ii.) | බදු කුලී | 3,076 | 2,796 | 670 |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 201 | 197 | 5 |

2:2:2 වරිපනම් බදු

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට වරිපනම් බදු හිඟ ශේෂය වූ රු.24,389,318 න් රු.13,116,953 ක් හෙවත් සියයට 54 ක් අය කර තිබූ අතර වර්ෂය අවසානයට මුළු හිඟය රු.22,368,701 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ සමස්ථ වරිපනම් බදු අයකිරීම් ප්‍රගතිය සියයට 63 ක් විය.

2:2:3 කර්මාන්ත හා ව්‍යාපාර බදු

සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු කර්මාන්ත හා ව්‍යාපාර බදු ශේෂය රු.184,340 ක් වූ අතර ඉන් ආයතන 45 කින් රු.82,150 ක් සමාලෝචිත වර්ෂයට අදාලවද, ආයතන 66 කින් රු.102,190 ක් වර්ෂ 1 සිට 5 දක්වා කාලයකට අදාලවද හිඟව පැවතුණි.

2:2:4 වෙළඳ ස්ථාන කුලී

2013 දෙසැම්බර් 31 දිනට වෙළඳ ස්ථාන කුලී හිඟය රු.661,290 ක් වූ අතර ඉන් නගර සභා බල ප්‍රදේශයට අයත් වෙළඳ ස්ථාන 124 කින් මාස 01 සිට මාස 12 දක්වා කාල පරාසයක් සඳහා රු.481,540 ක් හා වෙළඳ ස්ථාන 23 කින් මාස 12 සිට 24 දක්වා කාල පරාසයක් සඳහා රු.179,750 ක් වශයෙන් හිඟව පැවතුණි.

2:2:5 ඉඩම් විකිණීම මත අයකරනු ලබන සියයට 1 බද්ද

---------------------------------------------------

නගර සභා ආඥා පනතේ (255 අධිකාරියේ ) 165(ඇ)(1) වගන්තිය ප්‍රකාරව නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩමක් විකුණනු ලබන විට හෝ වෙන්දේසි කරනු ලබන විට එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට 1 කට සමාන බද්දක් නගර සභාව විසින් අයකර ගත යුතු වුවත් 2008 වර්ෂයේ සිට ඉඩම් විකිණීම් 08 කදී සියයට 1 ක බදු මුදල වශයෙන් රු.31,463,408 ක ප්‍රමාණයක් අයකර ඇතත් එම මුදල ඇස්තමේන්තුගත මුදලින් සියයට 1 ක් වූ අතර කිසිදු අවස්ථාවක ඉඩමේ විකණුම් වටිනාකමින් සියයට 1 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3 මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

2.3.1 කළමනාකරණ අකර්යක්ෂමතා

-----------------------------------

(අ) **<u>අත්තිකාරම් ගෙවීම්</u>**

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371(අ) ප්‍රකාරව කිසියම් කාර්යයක් සඳහා දෙන ලද අත්තිකාරම් මුදලක් එම කාර්යය නිම වූ වහාම පියවිය යුතු වුවද 1990 වර්ෂයේ සිට 2013 දෙසැම්බර් 18 දක්වා ගෙවා තිබූ අත්තිකාරම්වලින් රු.1,129,666 ක මුදලක් 2014 සැප්තැම්බර් 30 වන විටත් පියවා නොතිබුණි.

(ආ) **<u>කල් ඉකුත් වූ තැන්පතු</u>**

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 අනුව වර්ෂ 3 ක් ඉක්මවූ රු.6,751,299 ක් වූ තැන්පතු ආදායමට ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) **<u>කසල අපහරණය</u>**

2010 වර්ෂයේදී ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ සහ සභා අරමුදලින් රු.774,593 ක් වැය කර ජීව වායු ඒකකයක් ඉදි කර තිබුණද එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබූ අතර සභා බල ප්‍රදේශයේ එකතු වන කසල අපහරණය කිරීම වෙනුවෙන් ක්‍රමවත් වැඩපිළිවෙලක් සභාව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. 2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මොරටුව මහ නගර සභාව වෙත රු.5,166,642 ක මුදලක් සහ කසල ප්‍රවාහනය කිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයන් වෙත රු.240,080 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ඈ) **<u>ආර්ථික නොවූ වියදම්</u>**

අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් සභාව විසින් ගොනු කර තිබූ නඩුවක් සඳහා රු.9,000 ක් නීතිඥ ගාස්තු ලෙස ගෙවා තිබුණද නඩුව 2013 නොවැම්බර් 07 දින ඉල්ලා අස්කරගෙන තිබුණි. ඊට හේතු වී තිබුණේ පෙත්සම ලේකම්ගේ අත්සනින් හා නමින් ඉදිරිපත් කර තිබීමත් අවසන් නිවේදනය සභාපතිගේ අත්සනින් යවා තිබීමත්ය. මේ අනුව ගෙවා තිබූ මුදල අනාර්ථික ගනුදෙනුවක් වී තිබුණි.

(ඉ) **<u>අයවිය යුතු සේවක ණය</u>**

(i) 2013 දෙසැම්බර් 31 දිනට සේවක ණය ශේෂය රු.25,584,364 ක් වූ අතර ඉන් ස්ථාන මාරු වී ගොස් ඇති නිලධාරීන් 12 ක ගෙන් රු.90,861 ක් ද, විශ්‍රාම ගොස් ඇති නිලධාරීන් දෙදෙනෙකුගෙන් 13,638 ක්ද, සේවය හැර ගොස් තිබූ නිලධාරීන් 05 ක ගෙන් රු.127,583 ක්ද වශයෙන් වූ රු.232,082 ක ශේෂයෙන් අවු.01 සිට අවු.14 දක්වා කාල පරාසයකදී කිසිදු වාරිකයක් අය වී නොතිබුණි.

(ii) වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවත එන රු.534,074 ක හඳුනා නොගත් සේවක ණය ශේෂයක් ද විය.

2.3.2 සේවක මණ්ඩල කළමනාකරණය

-------------------------------------------

සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 250 ක් වූ අතර ඒ සඳහා ස්ථිර කාර්ය මණඩලය 232 ක්ද, අනියම් කාර්ය මණ්ඩලය 62 ක් ද විය. ඒ අනුව කාර්ය මණ්ඩල අතිරික්තය 44 ක් විය.
සභාවේ ප්‍රධාන පරිපාලක තනතුර වූ ලේකම් තනතුර 2012 ජනවාරි 04 දින සිටද, පරිපාලන නිලධාරි තනතුර 2014 ජනවාරි 01 දින සිටද පුරප්පාඩුව පැවතුණි.

2.3.3 <u>දේපල තහනම් කිරීම්</u>

2011 දෙසැම්බර් 31 දිනට වූ හිඟ වරිපනම් බදු මුදල් අයකරගැනීම සඳහා ආදායම් පරිපාලකවරුන් දේපල තහනම් කිරීමේ නිලධාරීන් වශයෙන් සේවයේ යොදවා තිබූ අතර හිඟ වරිපනම් බදු අයකරගැනීම සඳහා දේපල තහනම් ලදුපොත් නිකුත් කිරීම හා සභාවට මුදල් ප්‍රේෂණය කිරීම සම්බන්ධව ක්‍රියාකාරීත්වයේ පහත සඳහන් දුර්වලතා නිරීක්ෂනය කෙරුණි.

(i) හිඟ ලැයිස්තු සකස් කිරීම සඳහා විෂය ලිපිකරුවන් වෙත ලදු පොත් නිකුත් කිරීමේදී ඒවා අංක පිළිවෙලට නිකුත් කර නොතිබුණි.

(ii) අංක 56, 64, 74, 75, 89, 178, 179, 180, 181, 202, 297 දරන ලදු පොත් නිකුත් කළ දිනය හා නිකුත් කලේ කාටද යන්න සඳහන් කර නොතිබුණි.

(iii) 2012 ජූලි 23 දින නිකුත් කර තිබූ අංක 183 දරන ලදු පොත අස්ථාන ගත වී ඇති බවත් එහි අංක 18201 සිට 18247 දක්වා ලදු පත් ලියා තිබූ බවත් හිඟ ලැයිස්තු අනුව එකී ලදුපත්වල මුළු වටිනාකම රු.230,977 ක් වන බවත් 2013 මැයි 08 දිනැති සභාවේ කළමනාකාර සහකාර (වරිපනම්) ගේ ලිපියෙන් වාර්තා කර තිබුණද විගණිත දිනය වූ 2014 ජූනි 06 දක්වා මෙම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ගිණුම්කරණය
(ii) ආදායම් පරිපාලනය
(iii) වත්කම් කළමනාකරණය